

# ඩ්‍රැකිව්ලා ගේ මනාලියෝ



## පමා නොවී එම් අකුරට

**රසික සූරියආරච්චි**

[ra.suriyaarachchi@gmail.com]

සන්නස පාඨකයින් සඳහා මා ලියන "පමා නොවී එම් අකුරට" යනුවෙන් නම් කෙරුණු මේ කොලම පදනම් වී ඇත්තේ ඉගෙනුමෙහි අගය ගැන කියවෙන පැරණි සිංහල උපදේශතාත්මක කවියකින් උපුටාගත් එම පදවැලේ අදහසට කදිමට සමානුපාත වන "අප්පමාදෝ අමත පදං" යන පාලි පාඨය තම ආදර්ශ පාඨය ලෙසින් භාවිතා කරන කොළඹ ආනන්ද විද්‍යාලයේ උසස් පෙල හදරද්දී මා ලැබූ අත්දැකීම් මතය.

මා දහවන ශ්‍රේණියේ ඉගෙනුම ඇරඹීම සඳහා ආනන්දයට ඇතුලත් වූයේ නමවන ශ්‍රේණියේ පැවති "එන්.සී.ජී.ඊ." හෙවත් පොදු අධ්‍යාපන ජාතික සහතික පත්‍ර විභාගයේ ප්‍රතිඵල මතය. මගේ ප්‍රථිඵල තරමක් හොඳ වූ නිසාදෝ මා උසස් අධ්‍යයන ජාතික අධ්‍යාපන සහතිකය හෙවත් එච්.එන්.සී.ඊ සඳහා ආනන්දයට ඇතුලත් කරන්නට මගේ පියාව සිත්වී තිබුණි. වාසනාවකට හෝ අවාසනාවකට, මගේ බාල සොහොයුරන් දෙදෙනා උසස් පෙල හදුරණ සමය ලබනා විට කොළඹ දිස්ත්‍රික්කය දෙකට කැඩී ඉන් ගම්පහ දිස්ත්‍රික්කය ට අපේ ගම් පලාත අයිතිවී තිබීම නිසාත්, විශ්ව විද්‍යාලයට බඳවා ගැනීමේ දිස්ත්‍රික්ක පදනම ගම්පහ වාසී සිසුන්ගේ වාසියට හේතුවන බව වැටහීම නිසාත් මේ අවශ්‍යතාවය පැන නොනැගිණි.

පාසලට අයැදුම් පතක් ඉදිරිපත් කිරීමෙන් ටික දිනකට පසු අපට ප්‍රථිඵල සටහන සහ උප්පැන්න සහතිකය රැගෙන එහි එන්නැයි ඉල්ලීමක් ලැබුණි. එහිදී සිදුවූයේ සම්මුඛ පරීක්ෂණයක් නොව එකී ලියවිලි පරීක්ෂා කිරීම පමණි. ටික දිනකින් මා පාසලේ විද්‍යා විෂයය ධාරාවට ඇතුලත් කරගන්නා ලදී. විද්‍යා ධාරාවේ පන්ති නමයක් තිබුණු අතර, අළුතින් පාසලට ආ සිසුන්ගෙන් ඉන් පන්ති තුනක්ම සමන්විත විය.

සුසන්ත සුරන්ජිත් මා සමගම එලෙස ආනන්දයේ දහවන ශ්‍රේණියට ඇතුලත් වූ මගේ මිතුරෙකි. ඔහු මට ඊට පෙර මුණ ගැසී තිබුණේ, මා කලින් උගත් ගලහිටියාව මධ්‍ය විද්‍යාලයේ ටික කලකට ඔහු රැඳී සිටි අවදියේ දී ය. පෙර හැඳුනුම් කම මත ඔහු සමග කතාබහ කරද්දී සුසන්ත මට කියා සිටියේ ප්‍රාථමික පාඨශාලාවේ දී පහේ පන්තිය සමත් වීමෙන් අනතුරුව හයවැන්න සඳහා ආනන්දයට ඔහු ඇතුලත් කිරීමට ඔහුගේ පියා ඒ දිනවල උත්සාහ කල බවත්, නමුත් එය අසාර්ථක වූ බවත්ය. ඒ රසවත් කතාව මෙසේය.

ඒ දිනවල හයවැනි ශ්‍රේණිය සඳහා ආනන්දයට සිසුන් ඇතුලත් කරගෙන ඇත්තේ, ඒ සඳහා පැවැත්වූ සුවිශේෂ විභාගයක ප්‍රතිඵල මතය. සමහර විට එයට හේතුව වන්නට ඇත්තේ මේ කාලයේ ශිෂ්‍යත්ව විභාගය පැවැත්වුනේ හත්වැන්නේ දී වීමයි. සුසන්ත සුරන්ජිත් ට ද මේ විභාගයට පෙනී සිටීමට සිදුවිය. සුරන්ජිත් මට කියුවා යැයි මගේ මතකයේ රැඳී ඇති ආකාරයට, එම විභාග ප්‍රශ්ණ පත්‍රයේ තිබූ ගණිතය, බුද්ධි පරීක්ෂණය සහ භාෂාව පිළිබඳ ප්‍රශ්ණ අතර, සිංහල වාක්‍ය රචනාවක් ලිවීමට ද නියමිතව තිබී ඇත. ඒ සඳහා ලබා දී තිබුණු මාතෘකාව වී ඇත්තේ "මා කියවූ හොඳම පොත" යන්නයි. මා හිතවත් සුරන්ජිත් ඉතා පහසුවෙන් ඒ රචනාව ලියා ඇත.

විභාගය නිම වී නිවෙස බලා දුම්රියෙන් යද්දී, සුරන්ජිත් විභාගයේ විස්තරත්, රචනාව ගැනත් තම පියා දැනුවත් කළේය.

"පුතා මොන පොත ගැනද ලිව්වේ?" පියා විමසීය.

"මං ලිව්වේ ඩ්‍රැකිව්ලාගේ මනාලියෝ ගැන!" පුතා ගෙන් පිළිතුරු ලැබුණි. තම පියා හිසේ අත ගසා ගත්තේ ඇයි දැයි එදා දස හැවිරිදි පුත්‍රයාට තේරුණේ නැත.

මේ ප්‍රශ්ණ පත්‍රය සැදූ ගුරුවරයා ද, පසුව පිළිතුරු පරීක්ෂා කර ලකුණු දුන් ගුරුවරයා ද පමණක් නොව ඕනෑම සිහි බුද්ධිය ඇති වැඩිහිටියෙක් වුවද නිසැකවම අපේක්ෂා කරන්නේ "මා කියවූ හොඳම පොත" යන මාතෘකාව යටතේ අවුරුදු දහයක ඕනෑම කුඩා දරුවෙක් විසින් මාර්ටින් වික්‍රමසිංහ ගේ "මඩොල්දූව", ටී.බී. ඉලංග රත්න ගේ "අඹ යහළුවෝ" හෝ අඩු තරමින් ඔහුගේම විලම්බීත ගැනවත් ලියවේවිය කියායි. ඒ සම්මතයට සහමුලින්ම පිටින් යමින් සුරන්ජිත් ලියා තිබුනේ බ්‍රෑම් ස්ට්‍රෝකර් ගේ මුල් කෘතියෙන් චන්ද්‍ර අනගිරත්න (නැතිනම් ධීමත් ආනන්ද) විසින් පරිවර්තනය කරන ලද ඩ්‍රැකිව්ලාගේ මනාලියෝ පොත ගැනය. එදා සුරන්ජිත් ශිෂ්‍යයාට හයේ පන්තිය සඳහා ආනන්දයේ ගේට්ටුව විවෘත නොවීම පුදුමයක් නොවේ.

එදා සුරන්ජිත් පෙනී සිටි පහේ පන්තියේ විභාගයට මම ඉදිරිපත් නොවීමි. එසේ වූවා නම් බොහෝවිට මා ලියන්නට ඉඩ තිබුනේද "මඩොල්දූව" හෝ "අඹ යහළුවෝ" ගැන නොව තුන්වන ශ්‍රේණියේදී පමණ මා කියවූ ගුණදස ලියනගේ විසින් රචිත "මුළු හදින් මම ඇයට පෙම් කොට" නමැති නව කතාව ගැනයි. එය මා කියවූ මුල්ම නවකතාව වූවා පමණක් නොව දිගු කාලයක් යනතුරු මගේ ප්‍රියතම නවකතාව ද විය.

එදා සුරන්ජිත් ඩ්‍රැකිව්ලා ගේ මනාලියෝ පිළිබඳව ලියූ රචනාව එහි අක්ෂර වින්‍යාසය, භාෂා විලාසය සහ නිර්මාණාත්මක භාවය වැනි රචනා අගැයීමේ පොදු පටිපාටියට අනුකූලව එයට ලකුණු දෙනු වෙනුවට, ඉන් ඔබ්බට යමින් රචනාව සඳහා තෝරාගෙන තිබූ පොත පිළිබඳව ගුරුවරු තුල තිබූ යම් හණමිටි අදහස් මත පදනම්ව සුරන්ජිත් එම පරීක්ෂණයෙන් අසමත් කළා නම් එය වරදක් බව කිව යුතු නොවේ.

වාසනාවකට මෙන් සුරන්ජිත් ගේ පියා දෙවන වරටත් අයැදුම් පත් යොමුකර පෙර කී එන්.සී.ජී.ඊ විභාගයේ ප්‍රථිපල මත තම දරුවා, වසර හතරකට පසුව හෝ, ආනන්දයට ඇතුලත් කර ගත්තේය. පසුව කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ උගත් සුසන්ත සුරන්ජිත්, එක්සත් රාජධානියේ දී ද වැඩිදුර අධ්‍යාපනය ලබා අද ලංකාවේ විශ්ව විද්‍යාලයක අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ අංශ ප්‍රධාන ලෙස සේවය කරයි.

"පොතක් එහි පිට කවරයෙන් විනිශ්චය කරන්න එපා!" (Dont judge a book by its cover!) යන ඉංගිරිසි කියමනේ ප්‍රායෝගික භාවය මෙයින් හොඳාකාරව වැටහේ.

## අමා දහර 2009

අප්‍රේල් මස සන්නස පුවත්පතේ "සංක්‍රමණකයෙකුගේ සටහන" යන කොලම තුල සටහන් වූ 'අමා දහර' නර්තන ප්‍රසංගය පිළිබඳ ලියවිල්ල යම් අදහසක් එක් කිරීම සඳහා මෙය ලියා දක්වමි. එහි වූ පළමු වැකියෙහි එන නව සංස්කෘතියන් තුල වැඩෙන අපේ දරුවන් පෙරදිග සංස්කෘතික අංග කෙරෙහි යොමු කිරීම වෙනුවෙන් මෙල්බර්න් හි නැටුම් ආචාර්යවරුන් කරන සුවිශාල කැප කිරීම යන අදහස සමඟ මම ද එකඟ වෙමි. එහි දෙවන අදහස වන්නේ මෙල්බර්න් හි නැටුම් ගුරුවරුන් අතර අමා මේ සංස්කෘතිය තුල දරුවන්ට ගෝචර වන්නේ ද එවැනි නිර්මාණ බව කියමින් ලේඛකයා පළමු අදහසට පරස්පර විරෝධී අදහසක් දෙවන වාක්‍යයෙන් ඉදිරිපත් කරයි. පාඨකයා මෙම අදහස් දෙක අතර අතරමං වන්නේ බටහිර සංස්කෘතියක් තුල හැදෙන අපේ දරුවන්ට, අපේ කම සොයා ගැනීමට වඩා වැදගත් වන්නේ පෙරදිග නර්තන සම්ප්‍රදාය හා එහි ආශ්‍රිතව කෙරෙන නිර්මාණ ද, බටහිර හා හින්දි නාදරටා එක් වූ කලවං සම්ප්‍රදාය ද යන්නයි. අමා දහර 2009 ප්‍රසංගය තුල කොතැනක හෝ අපේ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය සොයා ගැනීමට මා හට නොහැකි විය. එහි අපේ කම හුවා දැක්වූයේ ප්‍රසංගය අවසානයේ ප්‍රේක්ෂකයන්ගෙන් සමු ගැන්මට පැමිනි පිරිමි ලමුන් සිව් දෙනෙකු-ගේ අතෙහි වූ ජාතික කොඩි හතරෙනි. දවල් සංදර්ශනයේදී එය ඔසවා සිටින්නට තරම්වත් ශික්ෂනයක් නොමැතිව ජාතික කොඩි බිමට දමමින් සිටි ඔවුන් එහි ඇති වැදගත්කමවත් අවබෝධ නොකරගත්තේ, සමස්ථ ශිල්පීන් බටහිර හා හින්දි බොලිවුඩ් නර්තනයන්හි ම නියැලීම නිසා යැයි විශ්වාස කරමි. සමස්ථ ප්‍රසංගයම අපගේ ශ්‍රී ලාංකිකයන් වැඩි දෙනෙකුගේ නිවෙස් වලින් සොයා ගත හැකි රිදී රැයක්, පුංචි තාරකා, කරච්චේ DVD තැටි හා බොලිවුඩ් සිනමා ගීතවල කොපි කිරීම් විය. බටහිර රටක් තුල ජීවත් වන අපගේ ශ්‍රී ලාකික දරුදැරියන් අපේ අනාගත පරපුරයි. නර්තනය, නාට්‍ය හෝ සිංහල භාෂාව වේවා අපේ දෙයක් ලමුන් එක් රැස් කරගෙනඋගන්වන ගුරුවරයා මීට වඩා වගකීමෙන් ක්‍රියා කළයුතු බව මාගේ අදහසයි.

**මේනකා පෙරේරා**

(ඩැන්ඩිනොන්)

